# මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව ලබාදීමේ ක්‍රියාවලිය



## 07.1 හැඳින්වීම

බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා වූ පොදු පරිපාලන අධිකාරය පළාත් පාලන ආයතනය වේ. බලප්‍රදේශයේ වැසිකිළිවල පවතින මළ අපද්‍රව්‍ය ඉවත් කිරීම ද මේ කාර්යයේ එක් අංගයකි.

## 07.2 නෛතික අධිකාරිය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වන වගන්තිය සමඟ කියවිය යුතු 93(ආ) වන උප වගන්තිය සහ සංශෝධන.

(ආ) කලින් කලට නිකුත් කර ඇති අදාළ වන සංශෝධන, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා, නියෝග, සහ උපදෙස්.

## 07.3 සුදුසුකම්

තම නිවසේ හෝ ආයතනයේ වැසිකිළි වළ පිරිසිදු කර ගැනීමට අවශ්‍යතාව ඇති යම් තැනැත්තකු මෙම සේවාව ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

## 07.4 ගාස්තුව

පළාත් පාලන ආයතනය විසින් කලින් කල තිරණය කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

## 07.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

මෙහි උප ලේඛනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

## 07.6 කාර්යය පටිපාටිය (සේවාව සපයන ලද විට)

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| සේවා ඉල්ලුම් පත්‍රය භාර ගැනීම. | | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| අදාළ තැන්පතු මුදල අය කර ගෙන ස්ථාන පරීක්ෂාවට යොමු කිරීම. | ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනම | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| සේවා සැපයීමට කටයුතු කිරීම. කළ හැකි /නොහැකි බව හඳුනාගැනීම. ඒ අනුව ගාස්තුව තීරණය කිරීම. | වැඩ කරන දින 07 තුළ. | විෂය නිලධාරි / ලේකම් /සභාපති |
| සේවාව සැපයූ බව වාර්තා කිරීම | සේවාව සැපයූ දින | පරීක්ෂක/බවුසර් රියදුරා |
| ගාස්තු ආදායම් ශීර්ෂවලට බැර කිරීම සහ ආපසු ගෙවිය හැකි මුදල් තිබේනම් ඉල්ලුම්කරුට ගෙවීම. | පරීක්ෂක / රියදුරාගේ වාර්තාව ලැබුණු වහාම වැඩකරන දින දෙකක් තුළ | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |

සටහන:-
1. නොවැළැක්විය හැකි හේතුවක් නිසා සේවාව සැපයීමට නොහැකිවන්නේනම්, ඒ බව ඉල්ලුම්කරුට දැන්විය යුතුය.
2. කලින් ලැබී ඇති ඉල්ලීම් සමඟ සලකා බලා ඉල්ලීම් ලැබී ඇති අනුපිළිවෙල අනුව සේවාව සපයන දිනය තීරණය කරනු ඇත.

## 07.7 කාර්යය පටිපාටිය (සේවාව සැපයීම නොහැකි වූ විට)

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| සේවාව සැපයීමට නොහැකි වූ බව වාර්තා කිරීම. | සේවාව සැපයීම සඳහා පිටත් ව ගිය දිනයේ ම | පරීක්ෂක / බවුසර රියදුරු |
| අය කර ගත යුතු මුදල සහ ආපසු ගෙවිය යුතු මුදලක් වේ නම්, ඒ ප්‍රමාණය ගණන් බැලීම සහ ඒ සඳහා අනුමතයට යොමු කිරීම. | රියදුරාගේ වාර්තාව ලැබුණු දින | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| අය කර ගැනීම සහ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සඳහා අනුමතය දීම. | නිර්දේශය ලැබුණු දින | ලේකම්/ සභාපති |
| අය කර ගත යුතු මුදල් සහ ආපසු ගෙවිය යුතු මුදල් තැන්පත් ගිණුමෙන් ආදායම් ශීර්ෂවලට බැර කිරීම සහ ආපසු ගෙවිය යුතු මුදල් නිදහස් කිරීම. | අනුමතය ලැබුණු දින | ලේකම්/ සභාපති |

## මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව ලබා දීමේ කොන්දේසි

1. සභාව සතු ගලි බවුසර ලබා දීම, ඒ සඳහා වන ඉල්ලුම් පත්‍ර ලැබෙන අනුපිළිවෙළ අනුව පමණක් සිදු කළ යුතු ය. කිසිදු අවස්ථාවක, ඒ අනුපිළිවෙළ වෙනස් කිරීමක් කරනු නොලැබේ.

2. ගලි බවුසර් සේවාව සැපයීමේ දී අයකරනු ලබන දෛනික ගාස්තුව සහ ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල් පහත පරිදි වේ. ගලි බවුසර සේවාව ලබා ගැනීමට පෙර ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල් ප්‍රමාණය සහ ගාස්තු ප්‍රමාණය කලින් ගෙවා ගලි බවුසරය වෙන් කරවා ගත යුතුය.

| විස්තරය | ගාස්තුව |
|---|---|
| (i) ගලි බවුසර් ගාස්තුව (බල ප්‍රදේශය ඇතුළත) | . . . . . . . . . . . . |
| (ii) ගලි බවුසර් ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත) | . . . . . . . . . . . . |
| (iii) ගමන් කළ දුර සඳහා අතිරේක අයකිරීම | . . . . . . . . . . . . |
| (iv) ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල | . . . . . . . . . . . . |

මෙයට අතිරේකව අදාළ පරිදි රජය මඟින් නියම කරන ලද බදු මුදල් (ඇත්නම්) ගෙවිය යුතුය.

3. පහත සඳහන් යම් ආකාරයකින් ඇතිවන කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා සේවාව සැපයීමට නොහැකි වුවහොත් අයකර ගත මුදල ඒ ඒ අවස්ථාව වෙනුවෙන් සටහන් කර ඇති ආකාරයෙන් ආපසු ගෙවීම සහ ගාස්තු අයකර ගැනීම සිදු කරනු ඇත.

   (i) ගලි බවුසරය අලුත්වැඩියාව සඳහා යෙදවීමට සිදුව ඇත්නම්, අදාළ සේවාව සැපයීමට ගලි බවුසරය යෙදවීමට නොහැකි වී ඇති විටක හෝ ගලි බවුසර සේවාව සැපයීමට අදාළ ස්ථානයට ගමන් කිරීමෙන් පසුව, ගලි බවුසරයේ ක්‍රියාකාරිත්වය නතර වුවහොත් හෝ වෙනත් යම් හේතුවක් මත සේවය සැපයීමට නොහැකි වුවහොත්, ගෙවන ලද සම්පූර්ණ මුදල ම ආපසු ගෙවනු ලැබේ. මුදල් අයකර ගැනීමෙන් පසුව බවුසරයේ ක්‍රියාකාරීත්වය නතර වීමකින් හෝ ඉල්ලුම්කරුගේ දෝෂයක් නොවන හේතුවක් මත සේවා සැපයීම වෙනත් විකල්ප ක්‍රමයක් අනුගමනය කරමින් කළ යුතුය.

   (ii) ගලි බවුසර සේවාව සැපයීමට අදාළ ස්ථානයට ගමන් කිරීමෙන් පසුව, වැසිකිළි වළේ ඇති මළ අප ද්‍රව්‍ය ඝන තත්ත්වයට පත්ව තිබීම හෝ වැසිකිළි වළේ අප ද්‍රව්‍ය පිටතට ගැනීමට හැකි වන පරිදි විවෘත කර දීමට හෝ එහි විවරයක් සාදා දීමට ඉල්ලුම්කරු අපොහොසත් ව ඇති අවස්ථාවක, ඒ ස්ථානයට යාමට සහ ආපසු ඒමට ගමන් කළ දුර සඳහා වන ගමන් ගාස්තුව අයකර ගෙන ඉතිරි මුදල පමණක් ආපසු ගෙවනු ලැබේ.

   (iii) ගලි බවුසරය වෙන්කරවා ගෙන තිබිය දී, ඒ වෙන් කිරීම ඉල්ලුම්කරුගේ අවශ්‍යතාව මත අවලංගු කරනු ලැබුවහොත්, ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයෙන් වන පරිපාලන ගාස්තුවක් අයකරගෙන ඉතිරි මුදල පමණක් ආපසු ගෙවනු ලැබේ.

4. ගලි බවුසරයේ ගමන් වාර සඳහා අයකරනු ලබන මුදල වශයෙන්, වෙන් කිරීමේ අවස්ථාවේ දී අයකර ගනු ලබන්නේ ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ අංක 4 යටතේ දක්වා ඇති කිලෝ මීටර් ප්‍රමාණයට අනුව වූ ගාස්තුවකි. එසේ වුව ද, යම් හෙයකින් ඒ දුර ප්‍රමාණය ඊට වඩා වැඩි වුවහොත් තව දුරටත් අයකර ගත යුතු මුදල අයකර ගැනීම සඳහා ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල යොදවා ගනු ලැබේ. එවැනි අවස්ථාවක ඒ මුදල සහ ඊට අදාළ වෙනත් බදු මුදල් අයකර ගෙන ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලෙන් ඉතිරිය පමණක් ගෙවනු ඇත.